ඇමුණුම 06

**"රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශයට අනුයුක්තව දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන තාක්ෂණ සහායක III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු පරිපාටිය"**

**හැඳින්වීම**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2009.02.20 දිනැති අංක 1589/30 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද කාර්ය පටිපාටික රීති I වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 202 රීතියේ විධිවිධාන අනුව, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශයට අනුයුක්තව දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන තාක්ෂණ සහායක III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු පරිපාටිය.

**02. වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් වන නිලධාරීන්**

I. කුමන ශ්‍රේණි වල නිලධාරීන්ද යන්න:-
   තාක්ෂණ සහායක III වන ශ්‍රේණියේ නිලධාරීන්

II. එක් එක් සේවා ස්ථාන වල සම්පූර්ණ කළ යුතු කාල පරිච්ඡේදයන්:-
   එක් සේවා ස්ථානයක වසර 03 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්
   වසර 05 ක් හෝ ඊට වැඩි සේවා කාලයක් එක් සේවා ස්ථානයක සේවය කරන නිලධාරීන්

III. ප්‍රමුඛත්වය ලබා දෙන ක්‍රමවේදයන් හා වෙනත් විශේෂිත විස්තර:-
   තම ස්ථිරව පදිංචි දිස්ත්‍රික්කයෙන් පිට දිස්ත්‍රික්කයක වසර 03 කට වඩා සේවය කර ඇති නිලධාරීන්

**03. වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ සංයුතිය**

I. ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (දිස්ත්‍රික් පාලන/ ප්‍රාදේශීය පාලන)
II. සහකාර ලේකම් (දිස්ත්‍රික් පාලන/ ප්‍රාදේශීය පාලන)
III. වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ විෂය පථයට අයත් වන නිලධර කණ්ඩායම් වලට හා සේවාවට අයත් රජයේ නිලධරයන්ගෙන් අවම වශයෙන් 15% ක නියෝජනයක් සහිත සෑම වෘත්තිය සමිතියක් විසින්ම නම් කළ නියෝජිතයෙක්

   හෝ

   පූර්ණකාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා නිලධාරියෙකු මුදා හැර ඇති සෑම වෘත්තිය සංගමයකම නම් කළ නියෝජිතයෙක්.

**04. වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුවේ සංයුතිය**

I. අතිරේක ලේකම් (ස්වදේශ කටයුතු)
II. ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (දිස්ත්‍රික් පාලන/ ප්‍රාදේශීය පාලන)
III. සහකාර ලේකම් (දිස්ත්‍රික් පාලන/ ප්‍රාදේශීය පාලන)

**05. වාර්ෂික ස්ථාන මාරු ලබා දීමේදී සැලකිල්ලට ගන්නා වෙනත් පොදු කරුණු**

පහත සඳහන් අවස්ථා වාර්ෂික ස්ථාන මාරු කමිටුවක විෂය පථයට ඇතුලත් නොවන්නේය

I. විනය හේතු මත කරනු ලබන ස්ථාන මාරු
II. සේවා අවශ්‍යතා මත කරනු ලබන ස්ථාන මාරු
III. නිලධාරීන්ගේ ඉල්ලීම මත කරනු ලබන අන්‍යෝන්‍ය ස්ථාන මාරු

## 06. වාර්ෂික ස්ථාන මාරු කාල සටහන:-

| | කාර්යය | දිනය |
|---|---|---|
| 01 | වාර්ෂික ස්ථාන මාරු දැන්වීම් නිකුත් කිරීම | ජුනි මස 30 වන දිනට පෙර |
| 02 | සම්පූර්ණ කරන ලද වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර අදාළ බලධාරියා වෙත ඉදිරිපත් කිරීම | ජූලි මස 31 වන දිනට පෙර |
| 03 | අදාළ බලධරයා විසින් අයදුම්පත්‍ර ස්ථාන මාරු කමිටුවට භාර දීම | අගෝස්තු මස 10 වන දිනට පෙර |
| 04 | වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ ස්ථාන මාරු යෝජනා අදාළ බලධාරියා වෙත ලිඛිතව භාර දීම | අගෝස්තු මස 31 වන දිනට පෙර |
| 05 | යෝජිත වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ දැන්වීම් නිකුත් කිරීම සහ වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු පත් කිරීම | සැප්තැම්බර් මස 15 වන දිනට |
| 06 | ස්ථාන මාරුවීම් පිළිබඳ සමාලෝචන කමිටු සඳහා අභියාචනා භාර ගැනීමේ අවසන් දිනය | සැප්තැම්බර් මස 30 වන දිනට පෙර |
| 07 | වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව විසින් යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් වන තම ලිඛිත නිර්දේශ අදාළ බලධාරියා වෙත ලිඛිතව භාර දීම | ඔක්තෝම්බර් මස 15 වන දිනට පෙර |
| 08 | අවසාන ස්ථාන මාරුවීම් නියෝග නිකුත් කිරීම | නොවැම්බර් මස 01 වන දිනට පෙර |
| 09 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම | නොවැම්බර් මස 15 වන දිනට පෙර |
| 10 | වාර්ෂික ස්ථාන මාරු බලාත්මක කිරීම | ජනවාරි මස 01 වන දින සිට |

## 07. ස්ථාන මාරු තීරණ වලට එරෙහි අභියාචනා සම්බන්ධ ක්‍රියා පටිපාටිය

7.1 ස්ථාන මාරු කිරීමක් පිළිබඳව දෙන ලද නියෝගයකට එරෙහිව කිසියම් රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම්, එම අභියාචනය ආකෘති පත්‍ර 03 A හා 03 B ප්‍රකාරව පමණක් ඉදිරිපත් කළ යුතු වන්නේය. තවද , තමන් විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු තහවුරු කිරීමට අදාළ ලියවිලි වල සහතික කළ පිටපත් එම අභියාචනය සමඟ ඉදිරිපත් කිරීමටද, ඔහු ක්‍රියා කළ යුතු වන්නේය.

7.2 රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු වන්නේ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් වන අතර, එම අභියාචනයේ පිටපතක් අදාළ පරිදි දෙපාර්තමේන්තු ප්‍රධාන හා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත ද යොමු කළ යුතු වන්නේය. තමන් වෙත ඉදිරිපත් වන අභියාචනය අප්‍රමාදවම තම නිරීක්ෂණ සහිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පලාන අමාත්‍යාංශයේ ලේකම්ගේ වගකීම වන්නේය. නිලධරයාට තම කැමැත්ත පරිදි, අභියාචනයේ ප්‍රගමන පිටපතක් සෘජුවම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ හැක්කේය.

7.3 ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක්, එම ස්ථාන මාරු කිරීමේ නියෝගය අදාළ රජයේ නිලධරයා වෙත ලද දින සිට දින 14 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වන්නේය. නියමිත කාලය තුළදී නොවන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නේය.

7.4 කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා නිලධරයෙකු විසින් භාර දෙනු ලබන අභියාචනය අදාළ සියලු ලිපිගොනු, ලිපි ලේඛන හා වාර්තා ආදිය ද, ඊට අදාළ තම නිරීක්ෂණ ද, නිර්දේශද සහිත එම අභියාචනය ලැබී දින 15 ක් ඇතුළත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට අදාළ දෙපාර්තමේන්තු ප්‍රධාන හා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා වග බලා ගත යුතු වන්නේය. එතකුදු වුවත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයෙහි XVIII වැනි පරිච්ඡේදයේ සඳහන් වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධ අභියාචනා අදාළ ලිපිගොනු, ලිපි ලේඛන, වාර්තා, නිරීක්ෂණ

හා නිර්දේශ සමඟ නොවැම්බර් මස 15 වැනි දිනට ප්‍රථම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය.

7.5 මෙම පරිච්ඡේදයෙහි සඳහන් නියමයන්ට අනුගතව තම අභියාචන ඉදිරිපත් කිරීම සෑම රජයේ නිලධරයෙකුගේම වගකීම වන අතර, ඊට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සලකා බලනු නොලබන්නේය.

7.6 ඉහත 7.4 වගන්තියේ සඳහන් ලියවිලි ලැබී දින 15 ක් ඇතුළත, ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව රජයේ නිලධරයෙකු විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා සම්බන්ධයෙන් තීරණයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ඇත්තේය.

7.7 ඉහත සඳහන් පරිදි ඉදිරිපත් කර ඇති අභියාචනයක් සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය සෘජුවම අභියාචක වෙත දන්වනු ලබන අතර, එහි පිටපත් අදාළ පරිදි රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් හා දෙපාර්තමේන්තු ප්‍රධාන වෙත යවනු ලබන්නේය.

7.8 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගයකින් හෝ තීරණයකින් හෝ අතෘප්තියට පත්වන රජයේ නිලධරයෙකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය පනතේ සඳහන් විධිවිධාන වලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

.................................................

ලේකම්,

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දිනය:-9/12/19..................

නිල මුද්‍රාව:- එස්. හෙට්ටිආරච්චි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
"නිල මැදුර"
ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05.